# සංකල්ප පත්‍රිකාව - ශ්‍රව්‍ය, දෘෂ්‍ය චිත්‍රාගාරයක ස්ථාපනය

## තාර්කිතය (Rational)

- ශ්‍රී ලාංකේය ශිෂ්‍යයාද දෙමාපියන්ද පෙලන ප්‍රධානතම සාධකයකි. පෞද්ගලික පන්ති (Tuition) අධ්‍යාපනය එයට හේතු වන කරුණක් ඇත. එනම්, ඉගෙනීමට අවශ්‍ය දැනුම සොයා ගැනීම සඳහා සිංහල/ දෙමල මාධ්‍ය දැනුම් මූලාශ්‍ර හිඟවීමයි. එසේම ගුරුවරයෙකුගේ මඟපෙන්වීම , කියාදීම ඉගැන්වීම ලෙස සලකන ශ්‍රී ලාංකේය සමාජය නිරන්තර ගුරුවරයෙකු අපේක්ෂා කරයි.

මෙම තත්ත්වය අධ්‍යාපනයේ පිරිහීමටත්, නිපුණතා අඩුවී දැනුමෙන් පමණක් සන්නද්ධ වීමටත්, සමාජ ගැටලු වැඩි වී සමාජය පිරිහීමටත් හේතු වී ඇත.

මෙම තත්ත්වයට පිළියමක් ලෙස දරුවන්ට අතිරේක ගුරුවරු, සහාය සහ දැනුමද ලබාදීමට හැකි හොඳම මාධ්‍යයකි, “ශ්‍රව්‍ය, දෘෂ්‍ය පාඩම්” නිර්මාණය කර ලබාදීම.

එමෙන්ම දක්ෂ ගුරුවරුන්ගෙන් පාඩම් ලබාදීමේ හැකියාවද, එම පාඩම් ද නැවත නැවත පරිහරණය කිරීමේ අවස්ථාවද එමඟින් ලබා ගත හැකිය.

මෙය දුරස්ථ අධ්‍යාපනය ලෙස හැඳෙන අතර, ඒ හා සමඟම අන්තර්ජාල තාක්ෂණය මගින් (Online) බහුල ලෙස ඉතා කෙටිකාලයකින් අසීමිත පාඩම් ප්‍රමාණයක් ළමයා වෙත විවෘත කල හැකිය.

එමෙන්ම වර්ණ, චලන, රූප, රිද්ම, රටා සහිත වර්තමාන පරපුරේ ජාන සංවේදිතාවටම ගැලපෙන ලෙස පාඩම් (Learning Content) නිර්මාණය කර දීමද කල හැකිය.

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව තුළ ශ්‍රව්‍ය, දෘෂ්‍ය ඒකකයක් ස්ථාපිත කිරීමේ ප්‍රයත්නය තුළින් ඉහත පරිදි මහත්ඵල අත්කරගැනීම පිණිස සෑම පන්තියටම, සෑම විෂයකටම අදාළව විවිධ මාදිලි ශ්‍රව්‍ය, දෘෂ්‍ය, සහසක්‍රීය (Interactive) පාඩම් සකසා (Learning Content) අන්තර්ජාල හෝ Audio,Video මාධ්‍ය මඟින් දරුවාට ලබාදීම සඳහා කටයුතු කල හැකි වේ.

# අරමුණු

I. පාසල් දරුවන් සඳහා ඉගෙනුම් සන්ධාර (Learning Content නිර්මාණය).
II. විභාග ඉලක්ක සඳහා පාසල් දරුවන්ට අතිරේක සහාය සැපයීම.
III. වර්තමාන පරපුරේ තොරතුරු මාධ්‍ය අවශ්‍යතාව සම්පූර්ණ කර දීම.
IV. වර්ණ, චලන, රූප, රිද්ම, රටා සහිත ආකර්ෂණීය පාඩම් ලබාදීම.
V. පාසල් දරුවන්ට හා ගුරුවරුනට අවශ්‍ය ප්‍රායෝගික අංශය සඳහා අත්දැකීම් ලබාදිම.
VI. අධ්‍යාපනයේදී මාධ්‍ය භාවිතය සඳහා ගුරුවරු පුහුණු කිරීම.
VII. දක්ෂ ගුරුවරුන්ගේ දක්ෂතා, දැනුම පළාතේ /රටේ සෑම දරුවෙකුටම ලබාගැනීමට අවස්ථාව සැලසීම

# ක්‍රමවේදය

I. රියදුරන් සඳහා වෙන් කර ඇති කාමරය ශ්‍රව්‍ය, දෘෂ්‍ය චිත්‍රාගාරයක් ලෙස සැකසීම *(රියදුරන්ට වෙනත් මධ්‍ය ස්ථානයක් ලබාදීම)*

II. චිත්‍රාගාරය සඳහා අවශ්‍ය සම්පත් ලබා ගැනීම.

III. චිත්‍රාගාරය සඳහා අවශ්‍ය මානව සම්පත යෙදවීම, පුහුණු කිරීම.

IV. චිත්‍රාගාරය තුළ හා බැහැර පටිගත කිරීම් සිදු කිරීම.

V. විවිධ මාදිලි ශ්‍රව්‍ය, දෘෂ්‍ය පාඩම් *(මසකට 50ක්)* නිර්මාණය කිරීම.

VI. සෑම පාඩමක්ම සංස්කරණය කිරීම හා අන්තර්ජාලයට එක්කිරීම ශ්‍රව්‍ය, දෘෂ්‍ය, සහසක්‍රීය මාධ්‍ය ලෙස දරුවන්ට ලබා දීම.

## කාල රාමුව

I. ශ්‍රව්‍ය දෘෂ්‍ය චිත්‍රාගාරය ඉදි කිරීම *(2020)*
II. අවශ්‍ය උපකරණ ස්ථාපනය *( 2020)*
III. අත්‍යවශ්‍ය උපකරණ ලබාගැනීම *(2021)*
IV. පාඩම් සැකසීම *(2021.01.24)*
V. මාසිකව විවිධ පාඩම් අන්තර්ජාලය හරහා මුදා හැරීම *(අඛණ්ඩව)*

# දැනට ලැබී ඇති ජයග්‍රහණ

I. ලංකාවේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු සතු ප්‍රථම හා එකම ශ්‍රව්‍ය, දෘෂ්‍ය චිත්‍රාගාරය අප සතුව ඇත.

II. අත්‍යවශ්‍ය උපකරණ සියල්ලම සපුරා ඇත.

III. Video පාඩම් 750, Interactive පාඩම් 1250, අකුර, ඉලක්කම්, Online Exam, විෂය බාහිර, විෂය සමගාමී වැඩ ඉටුකර ඇත.

IV. ගුරුවරු පුහුණු කිරීම හා පාඩම් සැකසීමට යොදාගැනීම මඟින් ගුරු සංවර්ධනයටද දායක වී ඇත.

V. e - නැණපියස LMS සඳහා ප්‍රධාන පාඩම් නිර්මාණය කර ශ්‍රව්‍ය, දෘෂ්‍ය චිත්‍රාගාරය.